දුරකථන/ தொலைபேசிகள்/Telephones :

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General – 2484728

පොදු / பொது / General – 2484500, 2484600, 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax – (941) 2473856, (941) 2484869

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහ භාණ්ඩාගාරය
அரச கணக்குகள் திணைக்களம்
பொது திறைசேரி
**Department of State Accounts**
**GENERAL TREASURY**

මගේ අංකය / எனது இல. / My No. – එස් ඒ / අයි සී /1 /3

ඔබේ අංකය / உமது இல. / Your No. –

දිනය / திகதி / Date – 2009 / 12 /

තැ. පෙ. අංකය 1559, පළමුවන මහල, මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
த. பெ. இல. 1559, முதலாம் மாடி, செயலகம், கொழும்பு 01, இலங்கை.
P. O. Box 1559, 1st Floor, The Secretariat, Colombo 01, Sri Lanka.

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක: 204/ 2009

සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත

## 2010 වසර තුලදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත <u>මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් දත්ත සම්ප්‍රේෂණය කිරීම</u>

අමුණා ඇති උපලේඛණයේ සඳහන් කර ඇති පරිදි සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2010 වසර තුලදී, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම සඳහා නියමිත දින පසුපිටෙහි දක්වා ඇත.

2. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් කිසියම් මාසයක් සඳහාවූ මාසික ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඒ හා පසුව යෙදෙන මාසයේ 15 වන දිනට පෙර සම්පිණ්ඩනය කිරීම කල යුතු යුතුවේ. එබැවින් එසේ නියම කරන ලද දිනයන්ට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි මාසික ගිණුම් සාරාංශය විද්‍යුත් තැපැල මගින් පමණක් එවීමට කටයුතු යොදන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. ඩිස්කට් මගින් ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම තවදුරටත් අඛණ්ඩව සිදුකිරීමට අදහස් කරන්නේ නම් විද්‍යුත් තැපැලෙන් එවීමට නොහැකි හේතූන් භාණ්ඩාගාරය වෙත දැන ගැනීමට සලස්වන මෙන් දන්වා සිටිමි.

3. එමෙන්ම යම් දත්ත ප්‍රතික්ෂේප කිරීමක් වෙතොත් ඒ සම්බන්ධයෙන් විද්‍යුත් තැපැල හරහා ඔබ වෙත දැනුම් දෙනු ලබන අතර, සිදු කරනු ලබන අවශ්‍ය නිවැරදි කිරීම්ද එසේ සඳහන් කරන ලද දිනයන්ට හෝ ඉන් පෙර ලබා ගැනීමට මෙම දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන බව මෙයින් දන්වා සිටිමි.

4. ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ පිළිබඳ ව ගත හැකි ක්‍රියාමාර්ගය විස්තර කර ඇති මු. රෙ. 426 කෙරෙහි ද ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

ඩී.පී.ආර්. සේනාධිපති
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත: විගණකාධිපති

| ගිණුම්කරණ මාසය | විද්‍යුත් තැපැල මගින් භාණ්ඩාගාරයට දත්ත එවීමට ඉඩ දී ඇති අවසාන දිනය | | | |
|---|---|---|---|---|
| | උපලේඛණ - I | | උපලේඛණ - II | |
| ජනවාරි | පෙබරවාරි | 05 | පෙබරවාරි | 10 |
| පෙබරවාරි | මාර්තු | 05 | මාර්තු | 09 |
| මාර්තු | අප්‍රේල් | 05 | අප්‍රේල් | 08 |
| අප්‍රේල් | මැයි | 05 | මැයි | 07 |
| මැයි | ජූනි | 04 | ජූනි | 09 |
| ජූනි | ජූලි | 05 | ජූලි | 08 |
| ජූලි | අගෝස්තු | 05 | අගෝස්තු | 09 |
| අගෝස්තු | සැප්තැම්බර් | 06 | සැප්තැම්බර් | 09 |
| සැප්තැම්බර් | ඔක්තෝබර් | 05 | ඔක්තෝබර් | 08 |
| ඔක්තෝබර් | නොවැම්බර් | 04 | නොවැම්බර් | 09 |
| නොවැම්බර් | දෙසැම්බර් | 06 | දෙසැම්බර් | 09 |
| දෙසැම්බර් | මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන 2010 මුදල් වර්ෂයේ ගිණුම් පියවීමේ චක්‍රලේඛයේ උපදෙස් පරිදි. | | | |